**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 396**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
දසවැනි පාර්ලිමේන්තුව
(පළමුවැනි සභාවාරය)

# පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දසවැනි වාර්තාව

(2025.09.24 වැනි දින ලංකා විදුලිබල මණ්ඩලය හා ඒ ආශ්‍රයෙන් පැනනැගුණු කරුණු සම්බන්ධයෙන් 2025.10.24 වැනි දින එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගම සහ එහි පරිපාලිත සමාගම් සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනය)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා විසින්
2025 දෙසැම්බර් මස 18 වැනි දින ඉදිරිපත් කරන ලදී

*2025 දෙසැම්බර් මස 18 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී*

**<u>දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය</u>**

**<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සංයුතිය</u>**

1. ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා, පා.ම., (සභාපති)
2. ගරු අර්කම් ඉල්යාස් මහතා,පා.ම.,  ( 2025.05.08 දින සිට)
3. ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම., (2025.03.21 දින සිට.)
4. ගරු (නීතිඥ) දයාසිරි ජයසේකර මහතා, පා.ම.,  (2025.05.20 දින සිට)
5. ගරු (නීතිඥ) අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම.,  (2025.03.21 දින සිට)
6. ගරු ඩී.වී. චානක මහතා, පා.ම.,  ( 2025.03.21 දින සිට)
7. ගරු (නීතිඥ) අනුරාධ ජයරත්න මහතා, පා.ම.,  (2025.03.21 දින සිට)
8. ගරු නලීන් බණ්ඩාර ජයමහ මහතා, පා.ම.,  ( 2025.03.21 දින සිට)
9. ගරු. එස්.එම් මරික්කාර් මහතා, පා.ම.,  (2025.03.21 දින සිට)
10. ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම.,  (2025.05.20 දින සිට)
11. ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම.,  (2025.03.21 දින සිට)
12. ගරු අබූබකර් අතම්බාවා මහතා, පා.ම., ( 2025.05.08 දින සිට)
13. ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.,
14. ගරු (නීතිඥ) නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම.,  (2025.03.21 දින සිට)
15. ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය, පා.ම.,
16. ගරු දිලිත් ජයවීර මහතා, පා.ම.,  (2025.03.21 දින සිට)
17. ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා, පා.ම.,  (2025.05.08 දින සිට)
18. ගරු සුජීව දිසානායක මහතා, පා.ම.,
19. ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,
20. ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම.,
21. ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා, පා.ම., (2025.03.21 දින සිට)
22. ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම.,
23. ගරු රුවන් මාපලගම මහතා, පා.ම.,
24. ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,
25. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම.,
26. ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම.,

27. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා, පා.ම., (2025.03.21 දින සිට)
28. ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.,
29. ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.,
30. ගරු (නීතිඥ) ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, පා.ම.,
31. ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම., ( 2025.03.21 දින සිට)

<u>කාරක සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය</u>

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වත්මන් කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

- සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) - හිමාලි සමරදිවාකර මෙය
- ප්‍රධාන නිලධාරි - එච්. රූපානි ද සොයිසා මිය
- නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී - එස්. ලක්ෂාන් වික්‍රම මයා
- පාර්ලිමේන්තු නිලධාරී - ජී. වී. එස්. කේ. කුමාරි මිය
- පාර්ලිමේන්තු නිලධාරී - අයි. එස්. ගෝමස් මිය
- පාර්ලිමේන්තු නිලධාරී - ජී. එල්. ඩී. ප්‍රනාන්දු මිය

**කාරක සභා වාර්තා**

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා බාගත කළ හැක.

www.parliament.lk

↓

සිංහල

↓

පාර්ලිමේන්තුවේ කටයුතු

↓

කාරක සභා

↓

කාරක සභා වාර්තා

# පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 1. | සභාපතිතුමාගේ සටහන | V |
| 2. | විධායක සාරාංශය | VI |
| 3. | මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය | 01 |
| 4. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මඟින් විමර්ශනය කරන ලද ආයතන | |
| | - ලංකා විදුලිබල මණ්ඩලය | 02-12 |
| | - එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගම සහ එහි පරිපාලිත සමාගම් | 13-21 |

## සභාපතිතුමාගේ සටහන

දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභා වාරයේදී 2025.09.24 දින බලශක්ති අමාත්‍යාංශය යටතේ පවතින ලංකා විදුලිබල මණ්ඩලයේ 2022 සහ 2023 වර්ෂ සඳහා අදාළ විගණකාධිපති වාර්තා සහ මණ්ඩලයේ වර්තමාන කාර්ය සාධනය පිළිබඳව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පූර්ණ විමර්ශනයක් සිදු කරන ලද අතර, ඒ ආශ්‍රයෙන් පැනනැගුණු කරුණුවලට අදාළව එල්.ටී.එල්. හෝල්ඩින්ස් සමාගම සහ එහි පරිපාලිත සමාගම් 2025.10.24 වැනි කාරක සභාව හමුවට කැඳවන ලදී. මෙම සියලු විමර්ශන ඇතුළත් කාරක සභාවේ දසවැනි වාර්තාව මෙලෙස ඉදිරිපත් කර සිටිමි.

2014 සිට 2022 වර්ෂය දක්වා ලංකා විදුලිබල මණ්ඩලය විදුලි ගාස්තු ඉහළ නැංවීමට අපොහොසත් වීම, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවලට අනුමැතිය ලබා දීමට අපොහොසත් වීම, ද්‍රවශීලතා ගැටළු හේතුවෙන් ඉන්ධන මිලදී ගැනීමේ ප්‍රමාදයන් ඇතිවීම ආදි කරුණු මත 2022 වර්ෂයේදී ශ්‍රී ලංකාව දැඩි විදුලි අර්බුදයකට මුහුණ දුන් අතර දිනකට පැය 18 ඉක්මවන විදුලි කප්පාදුවලට මුහුණ දීමට ජනතාවට සිදුවිය. රටේ ජනතාවට තම දෛනික ජීවිතයට හා දරුවන්ගේ අධ්‍යාපනික කටයුතුවලට දැඩි දුෂ්කරතා ගෙන දුනි. මෙම ආයතනයේ කළමණාකාරිත්ව අක්‍රමිකතා, අකාර්යක්ෂමතා හා එතුළින් පැනනැගුණු සුවිශාල මූල්‍ය අලාභයන් පවතින අතර ඒ පිළිබඳව දැනුවත් වීමට ජනතාවට අයිතියක් තිබේ. එම අවශ්‍යතාවය සපුරාලීම හා අදාළ ගැටළු සඳහා පිළියම් යෙදීමට උත්සාහ කිරීම මෙම විමර්ශනයේ මූලික අරමුණ විය. තවද, ලංකා විදුලිබල මණ්ඩලයේ කාරක සභා පරීක්ෂණය තුළින් පැන නැගුණු කරුණු මත එහි පරිපාලිත සමාගමක්ව පැවති එල්.ටී.එල්. හෝල්ඩින්ස් සමාගම සහ එහි පරිපාලිත සමාගම් කාරක සභාව හමුවට කැඳවන ලදී. ආරම්භයේදී විදුලිබල මණ්ඩලයේ බහුතර කොටස් හිමිකාරිත්වයක් සහිතවූ එම සමාගමේ රජය සතු කොටස් හිමිකාරිත්වය ක්‍රමයෙන් අවම කිරීමට කටයුතු කිරීම මත විගණකාධිපතිවරයා විසින් එම සමාගම විගණනය කිරීම වැළැක්වීමට, සමාගමට සම්බන්ධිත පාර්ශ්ව විසින් ගන්නා ලද විවිධ ක්‍රියාමාර්ග අදාළ විමර්ශණයේදී අනාවරණය කරගැනීමට කාරක සභාව සමත් විය.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය සාර්ථකව ඉටුකර ගැනීම සඳහා එම කමිටුවේ සාමාජික ගරු මන්ත්‍රීවරුන්ගෙන් ලැබෙන සහායත්, කථානායකතුමා ප්‍රධාන පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ උපදේශකවරුන් දෙදෙනාගේ සහායත්, භාණ්ඩාගාර නිලධාරින්ගේ සහ වැඩබලන විගණකාධිපතිතුමා ප්‍රධාන ජාතික විගණන කාර්යාලයෙන් ලැබෙන සහයෝගයත් අගය කොට සලකමි.

**වෛද්‍ය නිශාන්ත සමරවීර**
සභාපති
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

<u>විධායක සාරාංශය</u>

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් 2025 සැප්තැම්බර් මස 24වැනි දින පැවැත්වූ ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම) පිළිබඳව පැවති විමර්ශනයේදී 2022 සහ 2023 වසරවල විගණකාධිපති වාර්තා සහ ලංකා විදුලිබල මණ්ඩලයේ වත්මන් කාර්යසාධනය කෙරෙහි අවධානය යොමු කරන ලදී. එහිදී ආයතනයේ දැවැන්ත මූල්‍ය අලාභ හා ව්‍යුහාත්මක අක්‍රමිකතා අනාවරණය විය.

2025 ජූලි 30 වන විට, අනුමත සේවක සංඛ්‍යාව 26,783 ක් වුවද, මුළු පුරප්පාඩු සංඛ්‍යාව 7,775 ක් වූ අතර, ඒ සමගම නිලධාරීන් 2,798 ක අතිරික්තයක් ද (කණිෂ්ඨ ශ්‍රේණියේ 2,662 ක්) පැවතීම නිරීක්ෂණය විය.

2014 සිට 2022 දක්වා කාලය තුළ ලංවිමෙහි **සමුච්චිත අලාභය රුපියල් මිලියන 594,368 ක්** විය. අඩු පිරිවැයක් සහිත දිගුකාලීන විදුලි ජනන සැලසුම් ප්‍රමාදවීම, 2014 සිට 2022 අගෝස්තු 09 දක්වා විදුලි ගාස්තු සංශෝධනය නොකිරීම, සහ ද්‍රවශීලතා ගැටලු හේතුවෙන් ඉන්ධන මිලදී ගැනීමේ ප්‍රමාදයන් නිසා රුපියල් බිලියන **49.6** ක ප්‍රමාද පොලී ගෙවීමට සිදුවීම මෙම අලාභයට ප්‍රධාන හේතු විය.

ලංවිමෙහි කළමනාකරණ අකාර්යක්ෂමතාව හේතුවෙන්, රුපියල් මිලියන **3,165** ක් වටිනා **දෝෂ සහිත විදුලි ජනක යන්ත්‍ර 50** ක් මිල දී ගෙන ඇති අතර, ඒවා 2023 අගෝස්තු සිට 2025 ජූලි දක්වා කාලය තුළ පැය **102,623** ක් අක්‍රියව පැවති බව නිරීක්ෂණය විය. තවද, 2013 සිට 2024 දක්වා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව නිවාස ණය පොලී ප්‍රතිපූරණය සඳහා රුපියල් මිලියන **19,384.8** ක මුදලක් වැය කර ඇති අතර, කළමනාකරණ මණ්ඩල අනුමැතියකින් තොරව 2024 වර්ෂය සඳහා රුපියල් මිලියන **1,060.02** ක් ද ඇතුළුව අක්‍රමවත් දීමනා ගෙවා ඇත.

**එල්.ටී.එල්. හෝල්ඩින්ස් පිළිබඳ පරීක්ෂාව:**

ලංවිම පිළිබඳ විමර්ශනයේදී, එම මණ්ඩලය හා එල්.ටී.එල්. හෝල්ඩින්ස් සමාගම අතර පැවති සම්බන්ධතාවය සහ සමාගමේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ගැටලු මතුවීම හේතුවෙන්, ස්ථාවර නියෝග අංක 120 (6) යටතේ **අදාළ විමර්ශනයේම කොටසක් ලෙස** එල්.ටී.එල්. හෝල්ඩින්ස් සමාගම සහ එහි පාරිපාලිත සමාගම්, 2025 ඔක්තෝබර් මස 24 දින කාරක සභාව හමුවට කැඳවීමට තීරණය විය.

ආරම්භයේදී එල්.ටී.එල්. හෝල්ඩින්ස් සමාගමේ, ලංකා විදුලිබල මණ්ඩලය සතු කොටස් ප්‍රතිශතය 70%ක් වුවද, එල්.ටී.එල්. හෝල්ඩින්ස් සමාගමේ ඉහළ කළමණාකාරිත්වයේ සේවය කරන සම්බන්ධිත පාර්ශ්ව විසින් සාතිශය බහුතර කොටස් හිමිකාරිත්වයක් දරන LTG ESOT සේවක භාරය (පසුව Tekpro Investment Limited) සහ LTL ESOT Limited (පසුව Peradev Limited) විසින් එල්.ටී.එල්. හෝල්ඩින්ස් සමාගමේ කොටස් හිමිකාරිත්වයෙන් පිළිවෙලින් 10%ක් සහ 27% ක් ලෙස සමස්ථයක් ලෙස 37%ක කොටස් හිමිකාරිත්වයක් දරන බව අනාවරණය විය.

2024 ජනවාරි 01 දින ගන්නා ලද අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව, ලංවිම විසින් වෙස්ට් කෝස්ට් පවර් සමාගමට ගෙවීමට තිබූ රුපියල් බිලියන 79.4 ක ණය පියවීම සඳහා, ලංවිම සතු එල්.ටී.එල්. හෝල්ඩින්ස් සමාගමේ රුපියල් බිලියන 26 ක් වටිනා **28% ක කොටස්** එම සමාගමට පැවරීම සිදු විය. එමගින් ලංවිම සතු සෘජු කොටස් ප්‍රමාණය **35%** දක්වා අඩු විය.

එල්.ටී.එල්. හෝල්ඩින්ස් සමාගම, නීතිමය ක්‍රියාමාර්ග භාවිතා කරමින් අඛණ්ඩවම, විගණකාධිපතිවරයාට තම ගිණුම් විගණනය කිරීමට අවස්ථාව දීම වැළැක්වීමට උත්සාහ කර ඇති බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.


| **අනු අංකය** | **මාතෘකාව** | **පිටු අංකය** |
|---|---|---|
| **ලංකා විදුලිබල මණ්ඩලය සම්බන්ධව 2025.09.24 දින සාකච්ඡාවට ලක් කළ කරුණු** | | |
| **01** | පොදු තොරතුරු | 2 |
| **02** | ලංකා ට්‍රාන්ස්ෆෝමර් (එල්ටීඑල්) සමාගමේ කොටස් වෙස්ට් කෝස්ට් පවර් පුද්ගලික සමාගමට පැවරීම | 4 |
| **03** | වටිනාකම රු.මිලියන 3,165 ක් වූ දෝෂ සහිත විදුලි ජනක යන්ත්‍ර 50 ක් මිල දී ගැනීම | 4 |
| **04** | ඒස් පවර් ඇඹිලිපිටිය පෞද්ගලික සමාගමෙන් විදුලිය මිලට ගැනීම | 5 |
| **05** | අනුමත නොකළ දීමනා සඳහා ගෙවීම් | 6 |
| **06** | විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී හරහා භාණ්ඩාගාර බැඳුම්කරයන්හි සිදු කළ ආයෝජනවලට අදාළ | 7 |

| | | |
|---|---|---|
| | සුරැකුම්පත් නොමැති වීම | |
| **07** | පුත්තලම ගල් අඟුරු ව්‍යාපෘතිය වෙනුවෙන් මිල දී ගත් රු. මිලියන 124.30 ක් වටිනා වාහන 6ක් මණ්ඩලයට ආපසු භාර නොදීම | 7 |
| **08** | පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මඟින් විදුලිය නිපදවීම සඳහා නව ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය | 8 |
| **09** | උත්පාදන බල පත්‍රය කල් ඉකුත් වී ඇති ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්ගෙන් බලශක්ති මිල දී ගැනීම | 8 |
| **10** | රු. මිලියන 188.38 ක පිරිවැයට මිල දී ගත් ඉඩම් 18 ක් අපේක්ෂිත අරමුණු සඳහා යොදා නොගැනීම | 8 |
| **11** | යෝජිත මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීමේ ප්‍රමාදය | 9 |
| **12** | ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදලේ රීතිවලට පටහැනිව කටයුතු කිරීම | 9 |
| **13** | සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ පද්ධති හානි | 9 |
| **14** | ලංකා විදුලිබල මණ්ඩලය අලාභ ලැබීමට හේතු | 10 |
| **15** | ස්ථිර ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙක් පත් කර ගැනීමට අපොහොසත් වීම | 11 |
| **16** | කාරක සභාවේ කරුණු දැක්වීම හා නිර්දේශය | 12 |
| **එල්.ටී.එල්. හෝල්ඩින්ස් සමාගම හා පරිපාලිත සමාගම් පිළිබඳව 2025.10.24 දින සාකච්ඡාවට ලක් කළ කරුණු** | | |
| **01** | කාරක සභා රැස්වීම පැවැත්වීමේ අරමුණ | 13 |
| **02** | එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගමේ විකාශය | 13 |
| **03** | LTG ESOT භාරයේ සිට TIL සමාගම දක්වා සහ LTL ESOT Limited සමාගමේ සිට Peradev සමාගම් දක්වා විකාශය | 15 |
| **04** | එල්.ටී.එල්. සමාගමේ ලංවිම සතු කොටස්වලින් 28%ක් වෙස්ට් කෝස්ට් පවර් සමාගමට පැවරීම | 17 |
| **05** | විගණකාධිපතිවරයාට එල්.ටී.එල්. සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමට අවස්ථාව ලබා නොදීම | 18 |

| | | |
|---|---|---|
| **06** | කාරක සභා සාමාජික ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම.,ගේ රීති ප්‍රශ්නය | 20 |
| **07** | කාරක සභාවේ පැහැදිලි කිරීම සහ  නිර්දේශය | 21 |

## දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය
## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දසවැනි වාර්තාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ දසවැනි වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටිනි.

සියලු රාජ්‍ය සංස්ථා ද යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් සම්බන්ධව පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන ගිණුම් සහ වර්තමාන කාර්යසාධනය, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යය වේ.

වර්තමානයේ දී, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණය යටතට ගැනෙන, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා ජාතික අය වැය දෙපාර්තමේන්තුව යටතේ නියාමනය වනු ලබන පොදු ව්‍යාපාර 462 ක් පවතී. (මූලාශ්‍රය: රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව- 2025.09.04 දිනට)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ දී සිය පරීක්ෂණ කටයුතු ආරම්භ කළ 2025.02.18 දින සිට 2025.11.26 දක්වා කාල සීමාව තුළදී පහත සඳහන් ආයතන කැඳවා පරීක්ෂා කරන ලදී.

| අනු අංකය | ආයතනය | කාරක සභාව පැවැත් වූ දිනය |
|---|---|---|
| 1. | ජාතික තරුණ සේවා සභාව | 18.02.2025 |
| 2. | ජාතික තරුණ සේවා සභාව | 20.02.2025 |
| 3. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 27.02.2025 |
| 4. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 05.03.2025 |
| 5. | ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 12.03.2025 |
| 6. | ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 26.03.2025 |
| 7. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ | 27.03.2025 |

| | | |
|---|---|---|
| | අධිකාරිය | |
| 8. | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්) සමාගම | 02.04.2025 |
| 9. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 08.05.2025 |
| 10. | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්) සමාගම | 09.05.2025 |
| 11. | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | 15.05.2025 |
| 12. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 23.05.2025 |
| 13. | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 04.06.2025 |
| 14. | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 20.06.2025 |
| 15. | මහපොළ භාරකාර අරමුදල | 09.07.2025 |
| 16. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 17.07.2025 |
| 17. | රාජ්‍ය දැව සංස්ථාව | 23.07.2025 |
| 18. | සිවිල් ගුවන් සේවා අධිකාරිය | 20.08.2025 |
| 19. | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 10.09.2025 |
| 20. | භූවිද්‍යා හා පතල් කාර්යාංශය | 12.09.2025 |
| 21. | ලංකා විදුලිබල මණ්ඩලය | 24.09.2025 |
| 22. | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 08.10.2025 |
| 23. | ලංකා සතොස | 10.10.2025 |
| 24. | ලංකා විදුලිබල මණ්ඩලයේ පරීක්ෂණයට අදාළව එල්.ටී.එල්.හෝල්ඩින්ස් සමාගම | 24.10.2025 |
| 25. | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 13.11.2025 |
| 26. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 19.11.2025 |
| 27. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 26.11.2025 |

ඒ අතරින්, 2025.09.24 දින පරීක්ෂාවට ලක් කළ බලශක්ති අමාත්‍යාංශය යටතේ ඇති ලංකා විදුලිබල මණ්ඩලයේ 2022 සහ 2023 වර්ෂවලට අදාළ විගණකාධිපති වාර්තාව සහ මණ්ඩලයේ වර්තමාන කාර්යසාධනය පරීක්ෂාවට ලක් කොට නිකුත් කළ කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ මෙන්ම එම පරීක්ෂණය ඇසුරින් පැන නැගුණු කරුණු සම්බන්ධයෙන්

එල්.ටී.එල්.හෝල්ඩින්ස් සමාගම හා එහි පරිපාලිත සමාගම් සම්බන්ධයෙන් 2025.10.24 දින කාරක සභාව පැවැත්වූ විමර්ශනයට අදාළ නිරීක්ෂණ හා නිර්දේශ ද මෙම වාර්තාවට අන්තර්ගත කර ඇත.

<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය</u>

ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2022, 2023 හා 2024 වර්ෂයන්ට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය පහතින් දක්වා ඇත.

| <u>ආයතනය</u> | <u>විගණන මතය</u> | |
|---|---|---|
| | **<u>2022</u>** | **<u>2023</u>** |
| ලංකා විදුලිබල මණ්ඩලය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |

<u>විගණන මත වර්ග</u>

**01 <u>තත්ත්වාගණනය නොකළ මතය</u> (Unqualified Opinion)**

මූල්‍ය ප්‍රකාශන ආයතනයේ මූල්‍ය තත්ත්වය සාධාරණව ඉදිරිපත් කර ඇති බව

**02 <u>තත්ත්වාගණනය කළ මතය</u> (Qualified Opinion)**

වාර්තාවේ සඳහන් කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව.

**03 <u>මතය ව්‍යාවනය කිරීම</u> (Disclaimer of Opinion)**

ප්‍රමාණවත් හෝ උචිත විගණන සාක්ෂි හඳුනාගැනීමට නොහැකිවීම හේතුවෙන් ගිණුම් සම්බන්ධව මතයක් ප්‍රකාශ කළ නොහැකි බව.

**04 <u>අහිතකර මතය</u> (Adverse Opinion)**

ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව.

## ලංකා විදුලිබල මණ්ඩලය
## *(බලශක්ති අමාත්‍යාංශය)*

විමර්ශනය කරන ලද දිනය - 2025.09.24

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

### 01. පොදු තොරතුරු

### 1.1. කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු

**2025 ජූනි 30** දිනට ලංකා විදුලිබල මණ්ඩලයේ (ලංවිම) අනුමත සේවක සංඛ්‍යාව **26,783** ක් වූ අතර මුළු පුරප්පාඩු සංඛ්‍යාව **7,775** කි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද සේවක සංඛ්‍යාව ඉක්මවා **නිලධාරීන් 2,798** ක් අතිරික්තව බඳවාගෙන තිබුණි.

**ශ්‍රේණි අනුව තත්ත්වය:**

| සේවක ඛාණ්ඩය | අනුමත තත්ත්වය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|
| කළමනාකරණ | 1,911 | 644 | 40 |
| කළමනාකරණ නොවන | 6,586 | 1,517 | 96 |
| කණිෂ්ඨ | 18,286 | 5,614 | 2,662 |
| එකතුව | 26,783 | 7,775 | 2,798 |

**කළමනාකරණ ශ්‍රේණියේ අතිරික්තය:** විදුලි අධිකාරී තනතුරු සහ ඉංජිනේරු සහකාර තනතුරු ඒකාබද්ධ කොට තිබීමත්, විදුලි අධිකාරී තනතුරේ සිට ඉංජිනේරු සහකාර තනතුරට උසස් කිරීමේදී සේවක සංඛ්‍යා සීමා සැලකිල්ලට නොගෙන උසස්වීම් ලබා දීමත්, කළමනාකරණ ශ්‍රේණියේ පුරප්පාඩු **644** ක් තිබියදී **40** ක අතිරික්තයක් පැවතීමට හේතු විය.

**කළමනාකරණ නොවන ශ්‍රේණියේ අතිරික්තය:** පුරප්පාඩු **1,517** ක් තිබියදී **96** ක අතිරික්තයක් පැවතීමට හේතුව; කළමනාකරණ නොවන ශ්‍රේණියට සෘජු බඳවා ගැනීමකින් තොරව කණිෂ්ඨ ශ්‍රේණියට බඳවා ගැනීමත්, එම සේවකයින්ගේ උසස්වීම් තුළින් මෙම ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම බවත්, එහිදී ද සේවක සංඛ්‍යා සීමා සැලකීමකින් තොරව උසස්වීම් ලබා දීමත්ය.

**කණිෂ්ඨ ශ්‍රේණියේ අතිරික්තය:** කණිෂ්ඨ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු **5,614** ක් තිබියදී, **2,662** ක සේවක අතිරික්තයක් පැවතීමට හේතු වශයෙන් නිරීක්ෂණය වූයේ බලශක්ති අමාත්‍යාංශය සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය අතර ඇති කරගත් අවබෝධතා ගිවිසුමකට අනුව, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටමේ අභ්‍යාසලාභීන් මණ්ඩලයට බඳවා ගෙන, වසර **4** ක පුහුණුවකින් පසු කණිෂ්ඨ මට්ටමේ තාක්ෂණික පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීමත්, කණිෂ්ඨ ශ්‍රේණිය තුළදී පවා අර්ධ නිපුණතා ඇති සේවකයින් නිපුණතා ඇති සේවකයින් මට්ටමට උසස් කිරීමේදී, එම නිපුණතා මට්ටමේ අනුමත සේවක සංඛ්‍යාවට වඩා අතිරික්තයන් ඇති වීමත්ය. මෙය සේවක අභිප්‍රේරණය පිණිස මණ්ඩලය විසින් අනුගමනය කරන ප්‍රතිපත්තියක් විය.

**ප්‍රධාන පුරප්පාඩු:** ප්‍රධාන නීති නිලධාරී තනතුර **2014 ජූලි 04** දින සිටද, ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර **2024 නොවැම්බර් 30** දින සිටද පුරප්පාඩුව පවතී.

**කාරක සභාවේ නිරීක්ෂණය:** අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත, සේවක සංඛ්‍යාව පිළිබඳව සැලකීමක් නොමැතිව උසස්වීම් ලබා දීමේ ප්‍රතිපත්තියක් බඳවා ගැනීමේ පටිපාටියට ඇතුළත් වී තිබූ බව නිරීක්ෂණය විය. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් **26,000** කට ආසන්න සේවක සංඛ්‍යාවක් අනුමත කර තිබුණද, බඳවා ගැනීමේ පටිපාටියට අනුමැතියක් නොතිබූ බවත්, උසස්වීම් ලබා දීමේදී එම අනුමැතිය ලබා ගෙන නොමැති බවත් අනාවරණය විය.

**02. ලංකා ට්‍රාන්ස්ෆෝමර් (එල්.ටී.එල්.) සමාගමේ කොටස් වෙස්ට් කෝස්ට් පවර් පුද්ගලික සමාගමට පැවරීම**

එල්.ටී.එල්. සමාගම **1982** වර්ෂයේදී ලංකා විදුලිබල මණ්ඩලයේ (ලංවිම) බද්ධ ව්‍යාපාරයක් ලෙස ස්ථාපිත කරන ලදී. එහි ආරම්භයේදී කොටස්වලින් **70%** ක් මණ්ඩලය සතුව තිබුණු අතර **30%** ක් විදේශීය සමාගමක් සතුව පැවතිණි. 2001 වසරේදී, සමාගම සතු කොටස්වලින් 10% ක් LTG ESOT (LT Group Employees Ownership Trust – LTG ESOT) නම් සේවක භාරය වෙත පැවරීමෙන් පසු, මණ්ඩලය සතු කොටස් හිමිකාරිත්වය 63% දක්වා අඩු විය. ඉන්පසුව එල්.ටී.එල්. සමාගමේ ඉහළ කළමණාකරිත්වයේ පිරිසක් විසින් ආරම්භ කරන ලද LTG ESOT (Pvt) Ltd. නම් සමාගමක් විසින් විදේශීය සමාගම සතුව තිබූ 27%ක කොටස් මිලදී ගන්නා ලදී.

විදුලිය මිලදී ගැනීම උදෙසා ලංවිම විසින් වෙස්ට් කෝස්ට් පවර් පුද්ගලික සමාගමට ගෙවීමට ඇති ණය මුදලෙන් කොටසක් පියවීමට හිලව් වශයෙන්, **2024 ජනවාරි 01** දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, LTL සමාගමේ රුපියල් බිලියන **26** ක වටිනාකමකින් යුත් කොටස් ප්‍රමාණයක් වන **28%** ක්, අදාළ සමාගමට පැවරීම සිදු කරන ලදී. ඒ අනුව, ලංකා විදුලිබල මණ්ඩලය සතු කොටස් ප්‍රතිශතය **35%** ක් බවට පත් විය.

**කාරක සභාවේ නිරීක්ෂණ:** මණ්ඩලය සතුව කොටස් ප්‍රතිශතය **63%** ක් පැවති අවස්ථාවේදී පවා, විගණකාධිපතිවරයා විසින් සමාගමේ ගිණුම් විගණනය කිරීම එල්.ටී.එල්. සමාගම විසින් වළක්වන ලද බවත් 2024 වසරේ සිදු කරන ලද කොටස් පැවරීම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ හෝ විගණකාධිපතිවරයාගේ අධීක්ෂණයට සමාගම ලක්වීම වැළැක්වීමේ අරමුණින් සිදු කළ ක්‍රියාවක් වන බව.

**03. වටිනාකම රු.මිලියන 3,165 ක් වූ දෝෂ සහිත විදුලි ජනක යන්ත්‍ර 50 ක් මිල දී ගැනීම**

**රු.මිලියන 3,165** ක් වටිනා දෝෂ සහිත විදුලි ජනක යන්ත්‍ර **50** ක් මිලදී ගැනීම තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශවලට පරිබාහිරව සිදු වී ඇති බව **2024 මැයි 14** දින පැවති කාරක සභාවේදී පෙන්වා දී තිබුණි.

**ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය: 2024 මැයි 14** දින කාරක සභාව විසින් නිර්දේශ කළ පරිදි, අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ වාර්තාව සහ විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කළ වාර්තාව යන වාර්තා දෙකෙහි කරුණු අසමාන බැවින් ඒවා සමපාත කර ගැනීමට විගණකාධිපති, අමාත්‍යාංශ ලේකම් සහ ලංවිම සභාපතිවරයාගේ සහභාගිත්වයෙන් රැස්වීමක් පවත්වා ඒ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් මාස 2ක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කළ යුතුව තිබූ නමුත් එම වාර්තාව මේ දක්වා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොමැත.

**යන්ත්‍රවල කාර්යසාධනය:** විගණනයට අනුව, **2023** අගෝස්තු මස සිට **2025 ජූලි** මස අවසානය දක්වා, ප්‍රධාන වශයෙන්ම **තාක්ෂණික දෝෂ** හේතු කොට ගෙන, මෙම ජනක යන්ත්‍ර පැය **102,623** ක් අක්‍රියව පැවතුණු බවත්, **2020** වර්ෂයේ සිට **2025 ජූලි 30** දින දක්වා මෙම යන්ත්‍ර නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කටයුතු සඳහා **රු. මිලියන 629.14** ක් වැය වී තිබිණි.

## 04. ඒස් පවර් ඇඹිලිපිටිය පෞද්ගලික සමාගමෙන් විදුලිය මිලට ගැනීම

ඒස් පවර් ඇඹිලිපිටිය බලාගාරය සම්බන්ධ ගිවිසුම **2003 මැයි 09** දින අත්සන් කර ඇති අතර, එහි වලංගු කාලය **2005 අප්‍රේල් 06** සිට **2015 අප්‍රේල් 06** දක්වා වේ. මෙම ගිවිසුමේ පදනම Build, Own, Operate (**BOO**) වන බවත්, Build, Own, Transfer (**BOT**) පදනම යටතේ නොවන බවත් කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

**ගිවිසුම කල් ඉකුත් වීමෙන් පසු කරන ලද ගෙවීම්:** වසර **10** ක කාල සීමාව අවසන් වූ පසු බලාගාරයේ හිමිකාරිත්වය ලංවිම වෙත පැවරීමට මෙම ගිවිසුමෙන් අදහස් කර නොමැති බව නිරීක්ෂණය විය. කෙසේ වූවද ගිවිසුමේ වලංගු කාලය අවසන් වීමෙන් පසුව **2016** සිට **2024** දක්වා කාලය තුළ, මණ්ඩලය විසින් මෙම බලාගාරයෙන් විදුලිය මිල දී ගෙන ඇති අතර, ඒ සඳහා සමස්ථ වශයෙන් **ඩොලර් 29,085,134** මුදලක් ගෙවා තිබිණි.

**අතිරික්ත ගෙවීම් පිළිබඳ විමර්ශනය:** මෙහිදී අනාවරණය වූයේ, බලාගාරය මණ්ඩලයට විකිණීමට හිමිකරු ඉදිරිපත් කළ ඇස්තමේන්තුව වූ ඇ.ඩො. **17,000,000** (රු. මිලියන **2,446**) ට සාපේක්ෂව, ගෙවන ලද මුදලින් ධාරිතා ගාස්තුවේ Non–Escalable කොටස සඳහා පමණක් **ඩොලර් 21,701,362** (රු. මිලියන **3,650**) ක් ගෙවා ඇති බවයි. මෙය හිමිකරු ඉදිරිපත් කළ මිලට වඩා **127.7%** ක් වැඩි අගයකි.

## 05. අනුමත නොකළ දීමනා සඳහා ගෙවීම්

**2008 අප්‍රේල් 09** දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ දීමනා ලැයිස්තුවට ඇතුළත් නොවූ දීමනා **12** ක් සඳහා, මණ්ඩලය විසින් **2023** වර්ෂයේදී **රු. මිලියන 507.47 ක්** ගෙවා තිබුණු අතර, **2024** වර්ෂය සඳහා රු. මිලියන 1,060.02 ක් ද, **2025 ජූලි 30** දක්වා රු. මිලියන 627.58 ක් ද අමාත්‍ය මණ්ඩලයේ හෝ මුදල් අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

**රඳවා ගැනීමේ දීමනා:** තවද, වෘත්තීය දීමනාවට හිමිකම් ඇති නිලධාරීන් **601** දෙනෙකු සඳහා **2024** වර්ෂය වෙනුවෙන් **රු. මිලියන 191.3** ක් ද, **2025 ජූනි 30** දක්වා නිලධාරීන් **523** දෙනෙකු සඳහා රු. මිලියන 100.83 ක් ද වශයෙන් රඳවා ගැනීමේ දීමනාව ගෙවා තිබිණි.

**නිවාස ණය පොලී ප්‍රතිපූරණය: 2013** වර්ෂයේ සිට **2024** වර්ෂය දක්වා, මහා භාණ්ඩාගාරයේ කිසිඳු අනුමැතියකින් තොරව, නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ සේවකයින් විසින් ලබාගත් දේපළ ණය සඳහා අය කරන ලද පොලී මුදලින් **2/3** ක් මණ්ඩලය විසින් ප්‍රතිපූරණය කර ඇති අතර, ඒ සඳහා වැය වූ මුළු මුදල රු. මිලියන **19,384.8** ක් බවත්, මෙම ප්‍රතිපූරණය **1983** වර්ෂයේ සිට මණ්ඩලයේ සේවකයින්ට ලැබෙන වරප්‍රසාදයක් බව මණ්ඩලය පැවසුව ද, මෙය අතීතයට බලපැවැත්වෙන පරිදි අනුමත කිරීම සිදු කළ නොහැකි බව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී තිබුණු බවත් නිරීක්ෂණය විය.

**චක්‍රලේඛ උල්ලංඝනය:** මණ්ඩලය විසින් සේවකයින්ට ලබා දී ඇති වාහන ණය සඳහා **4.2%** ක පොලී අනුපාතයක් යටතේ පොලී අය කර ඇති බවත්, මෙය **1998 මාර්තු 08** දිනැති අංක **130** දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව **10%** සිට **14%** දක්වා වූ පරාසයක පොලී අනුපාතයක් යටතේ ණය ලබා දිය යුතු බවට වන නියමයට පටහැනි බව නිරීක්ෂණය විය

**06. විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී හරහා භාණ්ඩාගාර බැඳුම්කරයන්හි සිදු කළ ආයෝජනවලට අදාළ සුරැකුම්පත් නොමැති වීම**

**2008** වර්ෂයේ සිට, මණ්ඩලයේ විශ්‍රාම වැටුප් අරමුදලින් රු. මිලියන **400.4** ක් සහ සේවක අර්ථසාධක අරමුදලින් රු. බිලියන **2.3** ක් **එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී** හරහා භාණ්ඩාගාර බැඳුම්කරයන්හි ආයෝජනය කර තිබුනි. එහෙත් **2015** වර්ෂයේදී අනාවරණය වූයේ, මධ්‍ය තැන්පතු පද්ධතියේ මෙම ආයෝජනවලට අදාළ සුරැකුම්පත් නොමැති බවයි. සිදුවූ අලාභය අයකර ගැනීම ප්‍රමුඛ කාර්යය වී තිබූ බැවින්, එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී ආයතනයට එරෙහිව **දිසා අධිකරණයේ සහ වාණිජ මහාධිකරණයේ** නඩු කටයුතු ආරම්භ කර තිබුණි. **2024 මැයි 14** දින පැවති කාරක සභාවේදී දුන් නිර්දේශ අනුව, මෙම ආයෝජන සම්බන්ධයෙන් නැවත විමර්ශනයක් කිරීම සඳහා **2025 ජූලි 24** දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී **ත්‍රිපුද්ගල කමිටුවක්** පත් කර ඇති අතර, එහි වාර්තාව **2025 නොවැම්බර්** මසදී ලැබීමට අපේක්ෂා කොට ඇත.

**07. පුත්තලම ගල් අඟුරු ව්‍යාපෘතිය වෙනුවෙන් මිල දී ගත් රු. මිලියන 124.30 ක් වටිනා වාහන 6ක් මණ්ඩලයට ආපසු භාර නොදීම**

පුත්තලම ගල් අඟුරු ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් රු. මිලියන **124.30** ක් වටිනා වාහන **6** ක්, ව්‍යාපෘතිය අවසන් වූ පසු (ව්‍යාපෘතිය **2016** දී අවසන් විය) කොන්ත්‍රාත්කරු වන CMEV සමාගම විසින් මණ්ඩලයට ආපසු භාර දී නොමැති බවත්, මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් **2023 අගෝස්තු 16** දින සිදු කරන ලද පරීක්ෂණයකට අනුව, එම ව්‍යාපෘතියට අයත් **වාහන 11** ක් භාර දී නොතිබුණු බවත්, **2024 මැයි 14** දින පැවති කාරක සභා රැස්වීමේදී නිර්දේශ කළ පරිදි, වාහන ආපසු ලබා ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ අරමුණින් නීතිපතිවරයාගේ උපදෙස් **2024 ඔක්තෝබර්** මස ඉල්ලා ඇති බවත්, නීතිමය ක්‍රියාමාර්ග සඳහා යොමුව ඇත්තේ ව්‍යාපෘතිය අවසන් වී වසර **8** කට පසු බවත් නිරීක්ෂණය විය.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත අනුව, අදාළ වාහන ව්‍යාපෘතිය යටතේ ලියාපදිංචි වී ඇති බැවින්, ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතිය අවසන් වූ විට හිමිකාරිත්වය ලංකා විදුලිබල මණ්ඩලයට පැවරිය යුතුවේ.

**08. පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මඟින් විදුලිය නිපදවීම සඳහා නව ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය**

**2022** අංක **16** දරන විදුලිබල (සංශෝධන) පනතට අනුව, නව පුනර්ජනනීය බලාගාර ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා වූ අතර, **2022 ජූලි 28** සිට **2025 අප්‍රේල් 21** දක්වා කාලය තුළ, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) වෙත එකතුව මෙගාවොට් **2,639.7** ධාරිතාවක් සහිත ව්‍යාපෘති යෝජනා ලැබී තිබුණි. කෙසේවුවද **2025 ජූලි 30** දින වන විට, ඉන් ක්‍රියාත්මක කර තිබුණේ එකතුව මෙගාවොට් **30.8** ක ධාරිතාවක් සහිත බලාගාර පමණක් විය. නව ජනන සහ සම්ප්‍රේෂණ ව්‍යාපෘති ආරම්භ කිරීමට ඇති ප්‍රධාන බාධාව **ප්‍රාග්ධනය** වන බවත්, සියලුම ව්‍යාපෘති ජාත්‍යන්තර ණය දෙන ආයතන මඟින් සිදු කරන බැවින්, ආධාර ලබා ගැනීමේදී ගැටලු ඇති වී තිබුණි.

**09. උත්පාදන බලපත්‍රය කල් ඉකුත් වී ඇති ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්ගෙන් බලශක්ති මිල දී ගැනීම**

**2009** අංක **20** දරන සංශෝධිත ශ්‍රී ලංකා විදුලිබල පනතේ **7 (1)** සහ **43 (1)** වගන්තිවලට පටහැනිව, බලපත්‍රය කල් ඉකුත් වී ඇති ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් **තිදෙනෙකුගෙන්** බලශක්ති මිලදී ගැනීම සිදු වී තිබුණු බවත්, **2016** වර්ෂයේ සිට **2024** වර්ෂය දක්වා, කෙටි කාලීන පදනමින් ගිගාවොට් පැය **3,315** ක බලශක්ති ප්‍රමාණයක් මිලදී ගෙන ඇති බවත්, ඒ සඳහා රු. මිලියන 97,277 ක් වැය කර ඇති බවත්, මෙම කාලය තුළ අදාළ සමාගම්වලට මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් උත්පාදන බලපත්‍රයක් ප්‍රදානය කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය .

**10. රු. මිලියන 188.38 ක පිරිවැයට මිල දී ගත් ඉඩම් 18 ක් අපේක්ෂිත අරමුණු සඳහා යොදා නොගැනීම.**

**2000** වර්ෂයේ සිට රු. මිලියන **188.38** ක පිරිවැයට මිලදී ගත් ඉඩම් **18** ක් (ව්‍යාපෘති, ප්‍රාදේශීය කාර්යාල, උපපොළ ඉදිකිරීම් වැනි) අපේක්ෂිත අරමුණු සඳහා යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය. රු. මිලියන **81.39** ක් වටිනා ඉඩම් **5** ක් වෙනත් කටයුතු සඳහා යොදාගෙන තිබූ අතර, රු. මිලියන 80.67 ක් වටිනා ඉඩම් **11** ක් තවමත් **නිෂ්ක්‍රීය**ව පවතී.

**11. යෝජිත මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීමේ ප්‍රමාදය**

යෝජිත මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණයේ ප්‍රධාන ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව රු. මිලියන **4,774.6** කට **2021 අගෝස්තු 02** දින ප්‍රදානය කර ඇත. එහි ඉදිකිරීම් කටයුතු **2023 අගෝස්තු 15** දින අවසන් කිරීමට අපේක්ෂා කළද, **2023 මාර්තු 14** දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව, **2022** වර්ෂයේ ඇතිවූ ආර්ථික අර්බුදය සහ ද්‍රව්‍ය මිල ඉහළ යෑම හේතුවෙන් නතර කොට තිබුණි.

කොන්ත්‍රාත්තුව අවසන් කරන විට ඉදිකිරීම්හි භෞතික ප්‍රගතිය **13.2%** ක් පමණක් විය. **2025 ජූනි 30** දිනට මෙම ඉදිකිරීම් සඳහා වැය කර තිබූ රු. මිලියන **1,503** ක මුදලක් නිෂ්කාර්ය වී තිබුණි. කොන්ත්‍රාත්කරුට **2025 පෙබරවාරි 08** දිනට පෙර නිවැරදි කිරීමට දැනුම් දුන් දෝෂ පවා **2025 ජූලි 31** වන විට නිවැරදි කර නොතිබුණු අතර, ගොඩනැගිල්ල නැවත ඉදිකිරීම් කටයුතු ආරම්භ කර අවසන් කිරීමට වර්තමාන ඇස්තමේන්තුව රුපියල් **බිලියන 11** කට ආසන්න විය.

**12. ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදලේ රීතිවලට පටහැනිව කටයුතු කිරීම**

ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදලේ රෙගුලාසිවල රීති අංක **31** ප්‍රකාරව රීති සංශෝධනය කළ යුත්තේ කම්කරු කොමසාරිස්වරයාගේ සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතියට යටත්ව අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මඟිනි. කෙසේ වුවද ඉහතකී පරිදි අනුමැතියක් ලබාගැනීමකින් තොරව තොරව ණය ප්‍රදානය කිරීමට අදාළ රීති අරමුදල විසින් සංශෝධනය කර තිබුණි. ඒ අනුව සංශෝධනයට පෙර පැවති රීතිවලට පටහැනිව, **2024** වර්ෂය තුළදී, එකතුව රු .මිලියන **64.1** ක් වටිනා අධ්‍යාපන ණය **64** ක් සහ එකතුව රු. මිලියන **6,618.3** ක් වටිනා නිවාස ණය **4,945** ක් ප්‍රදානය කර තිබූ බවත් කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

**13. සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ පද්ධති හානි**

**2021** සිට **2024** වර්ෂය දක්වා සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ පද්ධති හානි ඉහළ මට්ටමක පැවති බවත්, **2024** වර්ෂයේදී ශුද්ධ විදුලි ජනනය (ගිගාවොට් පැය **16,726.260**) ට සාපේක්ෂව, පද්ධති හානිය **8.40%** ක් (ගිගාවොට් පැය **1405.794**) වූ බවත් කාරක සභාව නිරීක්ෂණය කරන ලදී .

**පද්ධති හානි (ගිගාවොට් පැය (GWh) සහ ප්‍රතිශතය)**

| වර්ෂය | ශුද්ධ විදුලි ජනනය (GWh) | පද්ධති හානි (GWh) | හානි ප්‍රතිශතය |
|---|---|---|---|
| **2024** | **16,726.260** | **1405.794** | **8.40%** |
| **2023** | **15,588.348** | **1378.926** | **8.85%** |
| **2022** | **15,942.236** | **1308.441** | **8.21%** |
| **2021** | **16,715.575** | **1581.839** | **9.46%** |

මණ්ඩලය විසින් **2018-2027** දිගුකාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම යටතේ **2019, 2021**, සහ **2023** වර්ෂ සඳහා ආරම්භ කිරීමට හඳුනාගත් සම්ප්‍රේෂණ යෝජනා ව්‍යාපෘති 10ක් සහ **නව කොටුමා උපපොළ යෝජනා දහයක්** පවා **2024 දෙසැම්බර් 31** දින වන විටත් ආරම්භ කර නොතිබුණු බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී .

**14. ලංකා විදුලිබල මණ්ඩලය අලාභ ලැබීමට හේතු**

**2014** වර්ෂයේ සිට **2022** වර්ෂය දක්වා කාලය තුළ ලංකා විදුලිබල මණ්ඩලයේ සමුච්චිත අලාභය රු. මිලියන **594,368** ක් වූ බවත් ,මෙම විශාල අලාභය සඳහා පහත දැක්වෙන ප්‍රධාන කරුණු බලපා ඇති බවත් කාරක සභාව නිරීක්ෂණය කරන ලදී:

1. අඩුම පිරිවැය දිගුකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පහළ මට්ටමක පැවතීම.
2. **2014** සිට **2022 අගෝස්තු 09** දින දක්වා විදුලි ගාස්තු සංශෝධනය නොකිරීම.
3. සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අඩුවීම.
4. දකුණු පළාතේ විදුලිබල පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා යෝජිත සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීමේ ප්‍රගතිය මන්දගාමී වීම.
5. ද්‍රවශීලතා ගැටලු හේතුවෙන් ඉන්ධන, ගල් අඟුරු සහ විදුලිය මිලදී ගැනීම් ප්‍රමාද වීම නිසා **2013** සිට **2022** දක්වා රු. බිලියන **49.6** ක් ප්‍රමාද පොලී ලෙස ගෙවීමට සිදු වීම.

6. ප්‍රධාන වශයෙන්ම ඉන්ධන, ගල් අඟුරු සහ කොටස් ප්‍රසම්පාදනය, විදුලිය මිලදී ගැනීම් සඳහා වූ මුදල් ප්‍රවාහ අවශ්‍යතා සඳහා ලබාගත් බැංකු අයිරා, කෙටි කාලීන ණය සහ දිගුකාලීන ණය සඳහා පොලී ලෙස **2013** සිට **2022** දක්වා රු. බිලියන **103.3** ක් ගෙවීමට සිදු වීම.

**විදුලි ගාස්තු සංශෝධනයෙන් පසු තත්ත්වය: 2022** අගෝස්තු **10** සිට **2023** **ඔක්තෝබර් 20** දක්වා කාලය තුළ විදුලි ගාස්තු **70%** සිට **757%** දක්වා වූ විශාල පරාසයකින් ඉහළ දැමීමෙන් පසු, **2024** වර්ෂය සඳහා රු. මිලියන **162,620** ක සැලකිය යුතු මෙහෙයුම් ලාභයක් (මූල්‍ය පිරිවැයට පෙර) සහ රු. මිලියන **144,394** ක ශුද්ධ ලාභයක් උපයා තිබුණු බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

**2025 වර්ෂයේ තත්ත්වය: 2025** වර්ෂයේ පළමු මාස **06** සඳහා රු. මිලියන **13,162** ක ශුද්ධ **අලාභයක්** වාර්තා වී තිබුණි .මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ජනන පුරෝකථන වෙනස්වීම් සහ ධාරිතා අනුපාත පුරෝකථන වෙනස්වීම් බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

**15. ස්ථිර ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙක් පත් කර ගැනීමට අපොහොසත් වීම**

ලංකා විදුලිබල මණ්ඩලයේ **ප්‍රධාන අභ්‍යන්තර විගණක 2024 නොවැම්බර්** මාසයේ විශ්‍රාම ගැනීමෙන් පසු, එම තනතුර මාස **11** ක කාලයක් තිස්සේ වැඩ බලන නිලධාරියෙකු යටතේ පවතින බැවින් රුපියල් බිලියන ගණනක ගනුදෙනු සිදු කරන ආයතනයක, වගවීමේ ක්‍රියාවලිය සඳහා අත්‍යවශ්‍ය තනතුරක් මෙලෙස පුරප්පාඩුව පැවතීම ආයතනයේ ඵලදායිතාවයට බලපෑම් ඇති කරන බව කාරක සභාව ප්‍රකාශ කළේය.

පළමුව රජයේ ප්‍රතිපත්ති අනුව අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩුව පිරවීමට **2024 සැප්තැම්බර්** මාසයේදී උත්සාහ කළද, සුදුසුකම් සපුරාලූ අයදුම්කරුවන් නොසිටි බැවින්, **2025** වර්ෂයේ මුල් භාගයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව බාහිරව බඳවා ගැනීම් සඳහා පුවත්පත් දැන්වීම් පළ කරන ලද බවත්, එහෙත්, සම්මුඛ පරීක්ෂණ මඟින් සුදුසු අයදුම්කරුවෙකු සොයා ගැනීමට අපොහොසත් වූ බවත් කාරක සභාවට කරුණු අනාවරණය විය.

ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර **අතිරේක සාමාන්‍යාධිකාරී** මට්ටමට උත්ශ්‍රේණිගත කිරීමට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් උපදෙස්

ලැබී තිබුණද, කාර්ය මණ්ඩලයේ යම් පාර්ශ්වවල විරෝධයක්ද මේ සම්බන්ධයෙන් පැන නැගී ඇති බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී .

## 16. කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ

**නිරීක්ෂණ:**

ලංකා විදුලිබල මණ්ඩලයේ කළමනාකාරීත්වයේ අකාර්යක්ෂම සහ නොසැලකිලිමත් ක්‍රියාකාරිත්වය හේතුවෙන් රජයට සහ ජනතාවට විශාල මූල්‍යමය හා පාලනමය පිරිවැයක් දැරීමට සිදු වීම හා එම අකාර්යක්ෂම සහ නොසැලකිලිමත් ක්‍රියාකාරිත්වය නිවැරදි කර ගැනීමට ප්‍රයත්නයක් නොදැරීම.

**කාරක සභාවේ නිර්දේශ:**

1. කාරක සභාවේදී සාකච්ඡාවට භාජනය වූ **සියලුම කරුණු සම්බන්ධයෙන් වහාම වෝහාරික විගණනයක් ආරම්භ කිරීම.**
2. එම විගණනයට අදාළ **තොරතුරු හා දත්ත ආරක්ෂා කර ගැනීමට** කටයුතු කිරීම.

තවද, ලංකා විදුලිබල මණ්ඩලය පිළිබඳ කාරක සභාවේදී පැන නැගුණු කරුණු සම්බන්ධයෙන් විමර්ෂණය කිරීමට **එල්.ටී.එල්.හෝල්ඩින්ස්** සමාගම **2025 ඔක්තෝබර් 24** දින කාරක සභාවට කැඳවීමට තීරණය කරන ලදී.

**<u>එල්.ටී.එල්.හෝල්ඩිංස් සමාගම සහ එහි පරිපාලිත සමාගම්</u>**

***(බලශක්ති අමාත්‍යාංශය)***

විමර්ශනය කරන ලද දිනය - 2025.10.24

<u>සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු</u>

**01. කාරක සභා රැස්වීම පැවැත්වීමේ අරමුණ**

මෙම රැස්වීමේ ප්‍රධාන අරමුණ වූයේ, **2025.09.24** දින පැවති ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම) පිළිබඳ කාරක සභා රැස්වීමේ දිගුවක් ලෙස, එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගම සහ එහි පරිපාලිත සමාගම් විගණකාධිපතිවරයාට සිය ගිණුම් විගණනය කිරීම සඳහා අවස්ථාව ලබා නොදුන් පසුබිමක, **පරිවේශණීය කරුණු** මත පදනම්ව කාරක සභාවේ පරීක්ෂාව සිදු කිරීම බවත්, ලංකා විදුලිබල මණ්ඩලය සහ එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගම ඇතුළු එහි පරිපාලිත සමාගම් අතර පවතින **නීත්‍යානුකූල සබඳතාවය** පිළිබඳව විමර්ශනය කිරීම මූලිකව සිදුවන බවත්, විගණකාධිපති විගණනයක් නොමැති බැවින් සමාගමේ වර්තමාන කාර්යසාධනය සම්බන්ධයෙන් **ස්වාධීන තක්සේරුවක්** සිදුකිරීම අපහසු බවත් කාරක සභාවේ සභාපතිවරයා විසින් අවධාරණය කරන ලදී.

**02. එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගමේ විකාශය**

එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගමේ ආරම්භය සහ කොටස් හිමිකාරීත්වයේ වෙනස්වීම් මෙසේ විය.

| **වර්ෂය** | **සිදුවීම සහ කොටස් හිමිකාරිත්වය** |
|---|---|
| **1980** | ලංකා විදුලිබල මණ්ඩලය සහ Bonar Long & Co. Ltd. අතර **බද්ධ ව්‍යාපාරයක් (Joint Venture)** ලෙස ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් ලිමිටඩ් සමාගම ස්ථාපිත කොට ඇත. ආරම්භක කොටස් හිමිකාරිත්වය: **ලංවිම 60%**, Bonar Long & Co. Ltd. **40%**. |

| වර්ෂය | සිදුවීම සහ කොටස් හිමිකාරිත්වය |
|---|---|
| 1982 | බෝනාර් ලෝංග් සතු කොටස්වලින් **10%ක්** ලංවිමට විකිණීමෙන් පසු: **ලංවිම 70%**, Bonar Long **30%**. |
| 1986-1990 | Bonar Long සතු කොටස් නෝර්වීජියානු සමාගම් වන **National Industri** සහ පසුව **ABB** සමාගම වෙත පැවරිණි. |
| 1996 | විදුලි අර්බුදයත් සමඟ **ලක්දනවි පරිපාලිත සමාගම** ආරම්භ කොට ඇත. |
| 2001 | සේවකයන් රඳවා තබා ගැනීම සහ **සතුරු පවරා ගැනීමක්** (hostile takeover) වැළැක්වීම අරමුණු කොටගෙන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව **LTG ESOT භාරය** පිහිටුවා, සමස්ත කොටස්වලින් **10% ක** නව කොටස් නිකුතුවක් සිදු කොට ඇත. ඒ අනුව කොටස් හිමිකාරීත්වය: ලංවිම 63%, ABB/Norway 27%, සේවක භාරය 10%. මෙම නව කොටස් මිලදී ගැනීම සඳහා එල්.ටී.එල්. සමාගමෙන් භාරය විසින් ණය මුදලක් ලබා ගෙන ඇති අතර අනාගතයේ දී ලැබෙන ලාභාංශ මඟින් එම ණය මුදල පියවීමට අපේක්ෂා කොට තිබිණි. |
| **2008 ඔක්තෝබර් 31** | සමාගම **එල්.ටී.එල්. හෝල්ඩිංස් (පුද්ගලික) සමාගම** ලෙස නම වෙනස් කරමින්, එල්.ටී.එල්. ට්‍රාන්ස්ෆෝමර්ස්, එල්.ටී.එල්. ගැල්වනයිසර්ස් සහ ලක්දනවි යන **පරිපාලිත සමාගම් 3ක්** ආරම්භ කොට ඇත. |

**2.1. ප්‍රධාන විධායක නිලධාරිගේ සේවා කාලය පිළිබඳ විමර්ශනය**

සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි **එම්.ජේ.එම්.එන්. මරික්කාර්** මහතා විසින් ලංවිමයෙන් ඉවත්ව එල්.ටී.එල්. සමාගමට සම්බන්ධ වූ කාල වකවානුව පිළිබඳව නිශ්චිත පිළිතුරක් ලබා දීමට අපොහොසත් වීම කාරක සභාවේ **දැඩි දෝෂ** දර්ශනයට ලක් විය.

<u>කාරක සභාවේ නිර්දේශය</u>

**එල්.ටී.එල්.හෝල්ඩිංස් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි එම්.ජේ.එම්.එන්. මරික්කාර් මහතා සම්බන්ධ පහත දත්ත කාරක සභාවට ඉදිරිපත් කිරීම.**

- **i. එම්.ජේ.එම්.එන්. මරික්කාර් මහතා ලංකා විදුලිබල මණ්ඩලයේ සේවයෙන් ඉවත් වූ දිනය.**
- **ii. ඒ මහතා ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් පුද්ගලික සමාගමේ සේවයට බැඳුනු දිනය.**
- **iii. ලක්දනවි සමාගම ස්ථාපනය කරන ලද දිනය**
- **iv. එලෙස ලක්දනවි සමාගම ස්ථාපනය කරන අවස්ථාවේදී මරික්කාර් මහතා සතුව දැනට පවතින කොටසට දායක වූයේද යන්න.**

## 03. LTG ESOT භාරයේ සිට TIL සමාගම දක්වා සහ LTL ESOT Limited සමාගමේ සිට Peradev සමාගම් දක්වා විකාශය

| වර්ෂය | සිදුවීම සහ කොටස් හිමිකාරිත්වය |
|---|---|
| **2007** | LTG ESOT භාරය විසින් ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් පුද්ගලික සමාගම වෙතින් ලබා ගත් **ණය** මුදල (අනාගතයේ දී ලැබෙන ලාභාංශ මඟින්) **සම්පූර්ණයෙන්ම පියවා** අවසන් කර ඇත. |
| **2017** | LTG ESOT භාරය, විදේශ වෙළෙඳපොළ ව්‍යාප්තිය සඳහා වන |

| වර්ෂය | සිදුවීම සහ කොටස් හිමිකාරිත්වය |
|---|---|
| | අවශ්‍යතාවය මත **Teckpro Investment Limited (TIL) සමාගම** බවට පරිවර්තනය වී ඇත. TIL සමාගමේ ප්‍රධාන කොටස් හිමියන් **15 දෙනෙකු** සාමූහිකව **76%** ක කොටස් ප්‍රමාණයක හිමිකාරිත්වය දරන බව නිරීක්ෂණය විය. **2007** සිට **2017** දක්වා භාරයේ ප්‍රතිලාභීන් වන සේවකයන්ට **ලාභාංශ බෙදා හැරීමක් සිදු වී නොමැති** බව කාරක සභාවට අනාවරණය විය |
| **2005** | ABB සමාගම ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් පුද්ගලික සමාගමේ ඔවුන් සතු **27%ක්** වූ කොටස් ප්‍රමාණය **රුපියල් මිලියන 513ක** මුදලකට විකිණීමට තීරණය කළ අතර, ලංවිම එම කොටස් මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් **LTL ESOT Limited** නම් නව සමාගමක් විසින් එම කොටස් මිලදී ගෙන ඇත. මෙම නව සමාගමේ ආරම්භක කොටස් හිමියන් LTG ESOT සේවක භාරයේ භාරකරුවන් හා පසුකාලීන TIL සමාගමේ බහුතර කොටස් හිමියන් 15 දෙනා අතරින් 7 දෙනෙකු බව කාරක සභාවට අනාවරණය විය.<br>මෙම කොටස් මිලදී ගැනීම කළමණාකාරිත්ව මිලදී ගැනීමක් (Management Buyout) වූ අතර ඒ සඳහා ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් පුද්ගලික සමාගමෙන් රුපියල් මිලියන 417ක ණය මුදලක් ලබා ගෙන ඇති බව කාරක සභාවට අනාවරණය විය. |
| **2010** | LTL ESOT Limited විසින් ලබා ගෙන ඇති **මිලියන 417 ක මූලික ණය මුදල සහ මිලියන 250 ක පමණ වාණිජ පොළියද** ඇතුළුව, අදාළ ණය මුදල සම්පූර්ණයෙන්ම පියවා අවසන් කොට ඇත. |
| **2018** | LTL ESOT Limited, **Peradev Limited** ලෙස නම වෙනස් කොට ඇත. **Peradev සමාගමේ** කොටස් හිමියන් 15 දෙනෙකු විසින් සමස්ත කොටස්වලින් 82% ක සාමූහික කොටස් ප්‍රමාණයක් දරන බවත්, මෙම 15 දෙනාම TIL සමාගමේ ද කොටස් හිමිකාරීත්වය |

| **වර්ෂය** | **සිදුවීම සහ කොටස් හිමිකාරිත්වය** |
|---|---|
| | දරන එකම පුද්ගලයන් බවත් කාරක සභාවට තහවුරු විය. |

**කාරක සභාවේ නිරීක්ෂණය:**
රජයේ මුදල් ද උපයෝගි කොට ගෙන සේවක ප්‍රතිලාභ සඳහා ඉහත කී සමාගම් ආරම්භ කළ ද, අවසානයේ එම සමාගම් දෙකේම (TIL සහ Peradev) සාතිශය බහුතර කොටස් ප්‍රතිශතයක්, **එකම පුද්ගලයන්** යටතට පත්වීමත්, අදාළ සමාගම් දෙක මඟින් එල්.ටී.එල්. සමාගමේ සමස්ථ කොටස් ප්‍රතිශතයෙන් 37% ක හිමිකාරිත්වය දැරීමත්, **ලබැදියාවන් අතර ගැටීමක්** (conflict of interest) ප්‍රබලව පෙන්නුම් කරන බවත් කාරක සභාව විසින් අවධාරණය කරන ලදී.

**04. එල්.ටී.එල්. සමාගමේ ලංවිම සතු කොටස්වලින් 28%ක් වෙස්ට් කෝස්ට් පවර් සමාගමට පැවරීම**
බලශක්ති මිලදී ගැනීම් වෙනුවෙන් වෙස්ට් කෝස්ට් පවර් පුද්ගලික සමාගම වෙත **2023 මාර්තු 31** වන දින වන විට ගෙවීමට නියමිතව තිබූ **රුපියල් බිලියන 79.4 ක** ණයක් ලංවිම සතු බැවින් අමාත්‍ය මණ්ඩල සන්දේශයක් අනුව මෙම ණය පියවීම සඳහා එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගමේ **ලංවිම සතු 63%ක් වූ කොටස්වල හිමිකාරීත්වයෙන් 28%ක්** එනම් රුපියල් බිලියන 26ක වටිනාකමක් සහිත කොටස්, වෙස්ට් කෝස්ට් පවර් සමාගමේ ණය පියවීම සඳහා පැවරීමට යෝජනා කර තිබීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.
මේ අනුව LTL සමාගමේ ලංවිම සතු කොටස් ප්‍රතිශතය 35% ක් බවට පත්විය. මෙම පැවරීම සාධාරණීකරණය කරමින් 2023.11.27 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශය එවක විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර ඇත.

ලංවිම සතු **63%ක්** වූ කොටස්වලට වාර්ෂිකව ලැබෙන **ලාභාංශ** භාවිතා කිරීමෙන් අදාළ ණය මුදල පියවීමේ හැකියාව තිබියදී, **කොටස් පැවරීම** හැර වෙනත් විකල්ප සලකා බැලීමක් සිදු වූයේද යන්න කාරක සභාව විසින් ප්‍රශ්න කරන ලදී.

**05. විගණකාධිපතිවරයාට එල්.ටී.එල්. සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමට අවස්ථාව ලබා නොදීම**

විගණකාධිපතිවරයා විසින් එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගම විගණනය කිරීම වැළැක්වීම අරමුණු කොටගෙන සමාගමට සම්බන්ධ පාර්ශ්ව මඟින් ගන්නා ලද ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කාරක සභාව විසින් පහත දැක්වෙන නිරීක්ෂණයන් සිදු කරන ලදී:

| වර්ෂය | සිදුවීම |
|---|---|
| 2015-2019 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයේ 36 (1) වගන්තියට අනුව රජය හෝ රාජ්‍ය සමාගමක් විසින් කොටස්වලින් 50%ක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් දරනු ලබන සමාගම් විගණනයට විෂය වන බවට නීතිමය පදනම සැකසිණි. කෙසේ වෙතත්, සිය කොටස් 50%ට වඩා අයත් ලංවිම රාජ්‍ය සංස්ථාවක් මිස රාජ්‍ය සමාගමක් නොවන බව දක්වමින් එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගම, 19 වැනි සංශෝධනයේ 36(1) වගන්තිය තම සමාගමට අදාළ නොවන බවට නීති උපදෙස් දක්වමින් විගණනය වැළැක්වීමට කටයුතු කර ඇති බව. |
| 2020 ජූලි 07 | එල්.ටී.එල්. කළමනාකාරිත්වයට සම්බන්ධ පුද්ගලයන් විසින් අභියාචනාධිකරණය හමුවේ නඩු ගොනු කර විගණනය වළක්වාලමින් දින 14ක් සඳහා බලපැවැත්වෙන අතුරු තහනම් නියෝගයක් ලබා ගැනීම. |

| | |
|---|---|
| 2020 ජූලි 22 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව සමාගම විගණකාධිපතිවරයාගේ විගණන විෂය පථයට ඇතුළත් බව නීතිපතිවරයා විසින් විගණකාධිපතිවරයා වෙත උපදෙස් ලබා දීම. |
| 2020 ඔක්තෝබර් | 19 වැනි සංශෝධනයේ 36(1) වගන්තියේ තිබූ නොපැහැදිලිතාවය 20 වන සංශෝධනය මඟින් ඉවත් වීමත් සමඟ විගණනය කිරීමට විගණකාධිපතිවරයා වලක්වාලමින් ලබාදී තිබූ අතුරු තහනම් නියෝගය 2022.10.10 දිනැති නියෝගය මඟින් අවහරණය කිරීම. |
| 2022- 2024 | සමාගම හා සම්බන්ධ පාර්ශ්වයන් විසින් දිගින් දිගටම විගණකාධිපතිවරයා විසින් ආයතනය විගණනය කිරීම වළක්වමින් නීතිමය පියවර ගැනීම |

කාරක සභාව අවධාරණය කළේ, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (3) උප වගන්තියට අනුව, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි හෝ ලියාපදිංචි වූ බවට සලකනු ලබන, 50% ක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රාජ්‍ය, ව්‍යවස්ථාපිත හෝ පළාත් පාලන ආයතනයක් විසින් සෘජුව හෝ වක්‍රව දරනු ලබන සමාගම්වල ගිණුම් විගණනය කිරීමට විගණකාධිපතිවරයාට බලය ඇති බවයි.

මේ අනුව **2025 මාර්තු 31** දිනට එල්.ටී.එල්. හෝල්ඩින්ස් සමාගමේ සමස්ත රාජ්‍ය හිමිකාරිත්වය පහත පරිදි විය:

| **ආයතනය** | **කොටස් හිමිකාරිත්වයේ ස්වභාවය** | **ප්‍රතිශතය (%)** |
|---|---|---|
| ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම) | සෘජු | **35.00%** |
| වෙස්ට්කෝස්ට් පවර් පුද්. සමාගම හරහා (වක්‍ර): | | |
| - රජය/භාණ්ඩාගාරය (41.45% x 28%) | වක්‍ර | **11.48%** |
| - LECO (Pvt) Ltd (18.8% x 28%) | වක්‍ර | **5.04%** |
| **සමස්ථ රාජ්‍ය හිමිකාරිත්වය** | **සෘජු + වක්‍ර** | **51.52%** |

එල්.ටී.එල්. හෝල්ඩින්ස් සමාගමේ සමස්ථ රාජ්‍ය හිමිකාරිත්වය 51.52% ක් වන බැවින්, සමාගම ජාතික විගණන පනතට අනුව විගණකාධිපතිවරයාගේ විගණනයට යටත් විය යුතු බව කාරක සභාව අවධාරණය කළාය.

## 06. කාරක සහා සාමාජික ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම.,ගේ රීති ප්‍රශ්නය

ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම., **ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 120 (2)** අනුව විගණකාධිපතිවරයා විසින් විගණනය නොකරන **එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගම** පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඉදිරියට කැඳවීමේ නීත්‍යානුකූලභාවය පිළිබඳව රීති ප්‍රශ්නයක් මතු කළේය.
ඊට පිළිතුරු දුන් සභාපතිවරයා පහත කරුණු දැක්වීම සිදු කළේය.

- **2025.09.24** දින පැවති ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම) සම්බන්ධ කාරක සභා විමර්ශනයේදී, ලංවිම සහ එල්.ටී.එල්. සමාගම අතර සම්බන්ධතාවය හා ලංවිම වෙත වූ බලපෑම සම්බන්ධයෙන් ගැටලු පැන නැගුණු බව.
- එබැවින්, එම ලංවිම විමර්ශනය සම්පූර්ණ කරගැනීම සඳහා **ස්ථාවර නියෝග අංක 120 (6)** යටතේ ලැබී ඇති බලතල අනුව, එල්.ටී.එල්. සමාගම අදාළ **විමර්ශනයේම කොටසක්** ලෙස කැඳවනු ලැබූ බව.

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම., **ස්ථාවර නියෝග අංක 120 (3)** අනුව ලංවිම විමර්ශනයෙන් පැනනැඟුණු "යම් කාරණයක්" සම්බන්ධයෙන් මෙම සමාගම කැඳවීම පැහැදිලි බව අවධාරණය කළේය. එසේ වුවද, ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම., සමාගම කැඳවීම සම්බන්ධයෙන් සිය විරෝධය ප්‍රකාශ කළේය.

## 07. <u>කාරක සභාවේ නිගමනය සහ නිර්දේශය</u>

එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගම විගණකාධිපතිවරයා විසින් සමාගම විගණනය කිරීම වැළැක්වීම අරමුණු කරගනිමින් සමාගමේ රජය සතු කොටස් ප්‍රමාණය **50%ට වඩා අඩු කිරීමට දිගින් දිගටම උත්සාහ කොට ඇති බව** කාරක සභාව පෙන්වා දෙන ලදී.
සමාගම තුළ විදුලිබල මණ්ඩලය මාර්ගයෙන් ආයෝජනය කර ඇත්තේ **මහජන මුදල්** බැවින්, එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගම ව්‍යවස්ථානුකූල බැඳීම්වලට අනුකූලව **පාරදෘෂ්‍ය ලෙස** ක්‍රියාකිරීමට බැඳී සිටින බවත්, විගණකාධිපතිවරයා විසින් විගණනය කිරීමට අවශ්‍ය **පහසුකම් සැලසීමට** සමාගම ක්‍රියාකළ යුතු බවත් කාරක සභාව **දැඩිව අවධාරණය** කළාය.

<u>කාරක සභාවේ නිර්දේශය</u>

**එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගම, විගණාධිපතිවරයා යටතේ විගණනය කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරි මැදිහත් වී කටයුතු කිරීම.**